0345

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය
ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර කළමනාකරණ උසස් සහතික පත්‍ර පාඨමාලාව
**OSC2402: කුඩා ව්‍යාපාර කළමනාකරණය**
**අවසාන පරීක්ෂණය – 2025/2026**
**කාලය – පැය දෙක (02) යි**

---

**දිනය: 2026 මැයි 17** **වේලාව: ප. ව. 01.30 – ප. ව. 03.30**

---

උපදෙස් :

- **ඕනෑම ප්‍රශ්න හතරක් (04) සඳහා පිළිතුරු සපයන්න.**
- **සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.**

1. (අ) 'කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය' (Small and Medium Enterprise/SME) යන්න සම්මත නිර්ණායකයක් (Standard Criterion) යොදාගනිමින් නිර්වචනය කරන්න. (ලකුණු 05)

 (ආ) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ගේ දායකත්වය උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

2. (අ) ශ්‍රී ලංකාවේ කාන්තා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හිමිකරුවන් තම ව්‍යාපාර ආරම්භ කිරීමේදී සහ කළමනාකරණය කිරීමේදී මුහුණ පාන්නාවූ අභියෝග කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

 (ආ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය තුල කාන්තා සහභාගීත්වය දිරිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට ගත හැකි පියවර මොනවාද? හේතු දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

3. (අ) ඔබේ අදහස අනුව, කුඩා ව්‍යාපාරයක් සඳහා 'පාලන' කළමනාකරණ ශ්‍රිතයේ ('Controlling' Management function) වැදගත්කම කුමක්ද? සුදුසු උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

 (ආ) කුඩා ව්‍යාපාර හිමිකරුවෙකු කළමනාකරණ ශ්‍රිතයන් (Management functions) පිළිබඳ මනා දැනුමකින් සමන්විත විය යුතු වන්නේ මන්ද යන්න කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

4. "තාක්ෂණය පෙර නොවූ විරූ ලෙස සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින, ඉතා ගතික ව්‍යාපාර පරිසරයක් තුළ වර්ථමානයේ ව්‍යාපාර ක්‍රියාත්මක වෙයි. එම නිසා වෙළඳපල තුළ රැඳී සිටීම සඳහා ඕනෑම ව්‍යාපාරයකට මෙම තාක්ෂණයන්ට අනුගත වීමට සිදුවේ. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට පවා මෙම තාක්ෂණික වෙනස්වීම්වලට මුහුණ දීමට සිදුවන අතර ඒවා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙත විවිධ අවස්ථා සහ අභියෝගයන් විවර කරයි."

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට තාක්ෂණික සංවර්ධනය හේතුවෙන් ඇතිවන අවස්ථා සහ අභියෝගයන් ඉස්මතු කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

5. (අ) ඔබේ අදහස අනුව, තම ව්‍යාපාර අසාර්ථක වීමෙන් වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර හිමිකරුවන් වර්ධනය කරගත යුතු ප්‍රධාන කුසලතා පහ (05) මොනවාද? සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ආ) ඔබ ජීවත්වන ප්‍රදේශයේ කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබ අදහස් කරන්නේයැයි උපකල්පනය කරන්න. ඔබේ ප්‍රදේශයේ ඇති ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීමට ඔබ අනුගමනය කරන උපක්‍රම (Strategies) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

**- සියලු හිමිකම් ඇවිරිණි -**